Sri Lanka Tourism

**Sri Lanka Tourism Development Authority, 80, Galle Road, Colombo 03, Sri Lanka.**
Hotline: 1912 Tel: +94 11 2426800/900, Fax: +94 11 2437953 E-mail: info@srilanka.travel, Web: www.srilanka.travel / www.sltda.gov.lk

මාගේ අංක **: SLTDA /SQA /AS/GEN/01**

2021 ජුලි 09

සියලුම සංචාරක නවාතැන් පහසුකම් සපයන්නන් වෙත,

මහත්මයාණනි/ මහත්මියණි,

**පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ හා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තා අධ්‍යනය කර ඒ පිලිබඳව ගත යුතු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීමේ අමාත්‍ය මණ්ඩල අනුකමිටුවේ අවසන් වාර්තාවෙන් ඉදිරිපත් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම.**

උක්ත කරුණ පිලිබදව අතිගරු ජනාධිපති තුමා විසින් 2021.05.07 දිනැතිව ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙහි ඇමුණුම අංක I හි අනු අංක 31 යටතේ දක්වා ඇති කරුණු පහත පරිදි වේ.

1. **අමුත්තන්ගේ තොරතුරු ලියාපදිංචි කිරිමේ ක්‍රියාපටිපාටියේ දෘඩි පාලනයක් සහිතව සිදු කිරිම.**

2. **අමුත්තන්ගේ වාර්තා වසර තුනක කාලයක් සදහා සංරක්ෂණය කිරිම.**

3. **නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සහ හෝටල් ආරක්ෂකයින් අතර සම්බන්ධීකරණ පහසුකම් සැළසීම.**

ඒ අනුව අමාත්‍ය මණ්ඩල ලේකම් විසින් යොමු කර ඇති අංක අපම/21/0863/301/016 දරණ 2021.05.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව උක්ත කරුණු සම්බන්ධයෙන් ඔබගේ අවධානය යොමුකර ඒ අනුව කටයුතු කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග වහාම ගන්නා ලෙස මෙයින් කාරුණිකව දන්වා සිටිමු.

ස්තුතියි,

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**

පිටපත්: 1. ජනාධිපති ලේකම්තුමා - ජනාධිපති ලේකම් කාර්යාලය

2. ලේකම්තුමා - සංචාරක අමාත්‍යාංශය

3. සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

4. අධ්‍යක්ෂ, ප්‍රමිති හා තත්ත්ව ආරක්ෂණ - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය